# ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ සූචි සම්පාදනයෙහි අතීතය, වර්තමානය සහ අනාගතය

**ඊ.කේ. ගුණරත්න**

**B A, Dip. MSSC (Kelaniya), ASLLA**

**ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී - කැලණිය විශ්වවිද්‍යාලය**

**සාරාංශය**

පළමුවරට ශාස්ත්‍රීය ක්‍රමයට පුස්තකාල සූචියක් පිළියෙල කලේ 1814 පැනිසිය. පුස්තකාල සූචි කිහිපයක එකතුවෙන් නිර්මිත ඒකාබද්ධ සූචිය කොන්ග්‍රස් පුස්තකාලයේ ව්‍යාපෘතියකි. ශ්‍රී ලංකාවේ විද්‍යා සභාව 1977 : UNICAST), සංවර්ධන තොරතුරු මධ්‍යස්ථානය 1978 (INICDEV), මධ්‍යම පරිසර අධිකාරිය 1993 (UNICEB), නමින් ඒකාබද්ධ සූචි කිහිපයක් නිර්මාණය කර ඇත. මේ සියල්ලේ එකතුවෙන් ජාතික ඒකාබද්ධ සූචිය නිර්මාණය කිරීම ජාතික පුස්තකාලයේ කර්තව්‍යයකි. එය අප රටේ පුස්තකාල සේවා මැනවින් පවත්වා ගෙන යාමට අත්‍යවශ්‍යය.

## හැදින්වීම

පුස්තකාල සූචි සම්පාදනය පුරාණයේ සිට පැවත ආ බව ඉතිහාසයෙන් පෙනේ. 1498 දී ඇල්ඩන් විසින් සාමාන්‍ය සූචියක් පිළියෙළ කර ඇති අතර 1548 දී කොනාර්ඩ් ගෙස්කර් ද සූචියක් පළ කොට ඇත. එහෙත් පළමුවරට ශාස්ත්‍රීය ක්‍රමයකට පුස්තකාල සූචියක් පළ කිරීමේ ගෞරවය හිමිවන්නේ බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ පුස්තකාලයාධිපතිව සිටි ඉතාලි ජාතික පැනිසිට ය. ඒ 1841 දිය.

පුස්තකාල සූචිය (Library Catalogue) යනු කිසියම් පුස්තකාලයක ඇති පුස්තකාල සම්පත් පිළිබඳව ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු අතුළත් ක්‍රමානුකූලව පිළියෙල කරන ලද ලැයිස්තුවක් ලෙස හැඳින්විය හැකිය. මේ අනුව පුස්තකාල සූචිය කිසියම් පුස්තකාලයක ඇති පුස්තකාල ද්‍රව්‍ය වල තොරතුරුවලට සීමා වන අතර අදාළ පාඨකයාට තමන්ට අවශ්‍ය පුස්තකාල ද්‍රව්‍ය සොයා ගැනීමට අවශ්‍ය වන මෙවලමකි.

මෙවැනි පුස්තකාල දෙකක හෝ වැඩි ගණනක පුස්තකාල සම්පත් පිළිබඳ ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු ඒකීය ස්වරූපයකින් සංවිධානය කිරීමෙන් ඒකාබද්ධ සූචියක් නිර්මාණය වේ. මෙම ඒකාබද්ධ සූචි පිළිබඳව ඉතිහාසයේ පළමු වරට සඳහන් වකවානුව නිවැරදිව කිව නොහැකි නමුත් විසිවන සියවසේ ආරම්භයේ සිට කොංග්‍රස් පුස්තකාලයේ ප්‍රධාන ව්‍යාපෘතියක් ලෙස භාවිතයේ පැවතුන බව පුස්තකාල හා තොරතුරු විද්‍යාව පිළිබඳ විශ්ව කෝෂයේ (1975) සඳහන්ව ඇත්තේ මෙසේය.

> The historical first use of the Union catalogue is not definitely known, but by the beginning of 20th century it had been applied to such major projects as the union catalogue of the Library of Congress.

ඒකාබද්ධ සුචිවල සංයුතිය හා කාර්යයන් ගැන කරුණු විමසීමේ දී පුස්.කාල විද්‍යා විශ්වකෝෂ, ශබ්දකෝෂ, පාරිභාෂික ශබ්ද මාලා මෙන්ම ඒ පිළිබඳ ලියැවී ඇති පාඨ ග්‍රන්ථ ඉවහල් කර ගත හැක. හැරල්ඩ් (1987) සිය පුස්තකාල විද්‍යා පාරිභාෂික ශබ්ද මාලාවේ ඒකාබද්ධ සුචිය හඳුන්වා ඇත්තේ මෙසේය.

> A catalogue of various department of a library, or a number of libraries, indicating their location. It may be an author a subject catalogue of all the books or of a selection of them and may be limited by subject or type of material

ඒකාබද්ධ සුචි සම්පාදනයෙහි විශේෂ ප්‍රයෝජන සලකා දියුණු නොදියුණු සෑම රටක් ම මෙම කාර්යයට ප්‍රමඛත්වය දී කටයුතු කර ඇත. පුස්තකාල සහයෝගිතාවය සාර්ථකව ක්‍රියාවට නැංවීම සඳහා ඒකාබද්ධ සුචි අත්‍යවශ්‍ය අංගයකි.. තොරතුරු පුපුරා යාම (Information explosion), මේ නිසා පුස්තකාල සම්පත් වර්ධනය වීම, පුස්තකාල සඳහා වෙන් කරන මුදල් ප්‍රමාණවත් නොවීම, කිසිම පුස්තකාලයකට සිය පාඨක අවශ්‍යතා තනිව පිරිමසාලිය නොහැකි වීම යන බාධක කිහිපයකට මුහුණපාන්නට සිදුව ඇත. මේ නිසා වර්තමානයේ පුස්තකාල සහයෝගිතා ක්‍රම (ප්‍රතිග්‍රහණය, සුචිකරණය, අන්තර් පුස්තකාල පිරුළු ක්‍රම) අනුගමනය කිරීමට පෙළඹී ඇත. ඒකාබද්ධ සුචි නිර්මාණය අත්‍යවශ්‍යව ඇත්තේ මේ නිසාය.

බර්නඩින් සිල්වා (1975) පුස්තකාල සේවා නොඅඩුව ලබා දීමට දියුණු රටවල පවා අනුගමනය කරන පුස්තකාල සහයෝගිතා ක්‍රම අප රටට සුදුසු පරිදි අනුගමනයෙහි ඇති වැදගත්කම පැහැදිලි කොට ඇත. මෙවැනි සහයෝගිතා වැඩ පිළිවෙලක් සංවිධානය කළ යුතු ආකාරය පිළිබඳවත් එය මැනවින් ක්‍රියාත්මක කිරීමට ඒකාබද්ධ සුචි සම්පාදනයෙහි අවශ්‍යතාවයත් දක්වා ඇත. ජාතික පුස්තකාලය මගින් ජාතික ඒකාබද්ධ සුචිය නඩත්තු කළ යුතුව පවත්නා අතර එයට පරිබාහිරව පළාත් පුස්තකාල මධ්‍යස්ථාන මගින් ඒකාබද්ධ සුචි සම්පාදනයෙහි හා නඩත්තු කළ යුතු ආකාරය දක්වා ඇත්තේ මෙසේය.

> The work of centers would involve the compiling and maintaining of union catalogues of the stock of member libraries; locating requested items and the controlling of inter-library loans; contributing union catalogue entries to the Nation Union catalogue; and maintaining records relating to Inter library loans of the region

දැනට වසර **25** කට ප්‍රථම පළාත්බදව ඒකාබද්ධ සුචි සම්පාදනය හා එමගින් පෝෂිතව වැඩෙන ජාතික ඒකාබද්ධ සුචිය පිළිබඳව දක්වා ඇති අදහස් තවමත් හරියාකාරව ක්‍රියාවට පරිවර්තනය නොවීම මෙරට ඒකාබද්ධ සුචි සම්පාදනයෙහි අතීතය හා වර්තමානය ගැන සෑහීමකට පත්වීමට බාධාවකි.

කෙසේ වෙතත් ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ සූචි සම්පාදනය 1977 දක්වා අතීතයට දිව යයි. ජාතික විද්‍යා සභාව යටතේ ක්‍රියාත්මක වුනු විද්‍යා හා තාක්ෂණ තොරතුරු මධ්‍යස්ථානයට ද මෙහි ගෞරවය හිමි වේ. මෙම මධ්‍යස්ථානය සංවිධානය කළ සේවා අතුරින් විද්‍යා හා තාක්ෂණ පොත් සම්බන්ධයෙන් ඒකාබද්ධ සූචිය සැකසීම ප්‍රධානය. UNICAST ඒකාබද්ධ සූචියෙහි මූලික අරමුණ වූයේ ශ්‍රී ලංකාවේ පුස්තකාලයන්හි විද්‍යා හා තාක්ෂණ පොත් පිළිබඳව සංයුක්ත සූචියක් සම්පාදනය කිරීමයි. පුස්තකාල 30 ක පමණ ග්‍රන්ථ, විද්‍යා විඥාපන මධ්‍යස්ථානයට SLSTIC (Sri Lanka Scientific and Technical Information Center) එවීමෙන් මෙම ඒකාබද්ධ සූචිය ක්‍රියාත්මක විය. මෙය ක්‍රියාත්මක කිරීම පියවර තුනකින් සමන්විත විය. පළමු පියවර කාඩ්පත් මගින් සූචිය සම්පාදනය කිරීමයි. කර්තෘ අකාරාදිව සම්පාදනය කළ මෙම සූචිය ත්‍රෛමාසික ප්‍රවෘත්ති සංග්‍රහයක් ලෙස ද නිකුත් කරන ලදී. 1983 දී SLSTIC ආයතනය කුඩා පරිගණකයක් මිළ දී ගැනීමත් සමග ඒකාබද්ධ සූචියේ දෙවන පියවර ආරම්භ විය. ශ්‍රී ලංකාවේ පුස්තකාල කටයුතු සම්බන්ධයෙන් පළමු වරට පරිගණකයක් මිලදී ගැනීම මෙහි ලා විශේෂයෙන් සඳහන් කළ යුතුය. විද්‍යා තාක්ෂණය සමග ඉදිරියට යන දියුණු රටවල් සමග අප ද පියවර තැබීමක් වන හෙයිනි. පරිගණකයට ඒකාබද්ධ සූචි තොරතුරු ඇතුළත් කිරීම ද මේ සමග ආරම්භ විය. මෙම සූචිය ඇසුරින් ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු සංග්‍රහයන් , සූක්ෂම චිත්‍ර පිටපත්, ප්‍රතිග්‍රහණ ලැයිස්තු වැනි ග්‍රන්ථ විද්‍යා මෙවලම් රාශියක් ද සම්පාදනය අගය කළ යුතුය. මෙම විද්‍යා තාක්ෂණ ඒකාබද්ධ සූචියෙහි තුන්වන අදියර CDS/ISIS මෘදුකාංගය භාවිතයෙන් සම්පාදනය කිරීමට සැළසුම් කර තිබුණි. සහභාගී වන පුස්තකාල ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු පොදු එකගතාවයකින් යුතුව සැපයීමට පෙළඹීම මෙහි ලා වැදගත්ය. කෙසේ වෙතත් මෙම අදියර ක්‍රියාත්මක කිරීමට විද්‍යා හා තොරතුරු මධ්‍යස්ථානයට නොහැකි විය. මෙරට ඒකාබද්ධ සූචි සම්පාදනයෙහි තවත් පියවරක් ලෙස 1978 සංවර්ධන තොරතුරු මධ්‍යස්ථානය මගින් සමාජ විද්‍යාව හා සංවර්ධන විද්‍යාව පිළිබඳ ඒකාබද්ධ සූචියක් UNICDEV (Union Catalogue of Development Information) සම්පාදනය කිරීම සඳහන් කළ හැකිය. මෙය මීට කලින් නිර්මාණය වී තිබුණු UNICAST ඒකාබද්ධ සූචියේ කර්තෘ සූචියට සමානය. මෙම විෂය ක්ෂේත්‍රවල පුස්තකාල මගින් එවන ලද නව ප්‍රවේශ පිළිබඳ ග්‍රන්ථ විද්‍යාත්මත තොරතුරුවලින් මෙය සම්පාදනය විය.

ඉහත සඳහන් විශේෂ විෂය ක්ෂේත්‍රයට සීමා වුනු තවත් ඒකාබද්ධ සූචියක් නිර්මාණය කිරීමට 1993 මධ්‍යම පරිසර අධිකාරිය පියවර ගැනීම මෙරට ඒකාබද්ධ සූචි සම්පාදනයෙහි තවත් වැදගත් පියවරකි.. UNICEB (Union Catalogue of Environment Books) පරිසර විෂය හා සම්බන්ධ වන ජාලයට අයත් පුස්තකාල මගින් එවන ග්‍රන්ථ විද්‍යා තොරතුරු ඇසුරින් නිර්මාණය විය. සමහරු කාඩ්පත් මගින් ද, ආවිෂ්ඨ පත්‍රිකා, ප්‍රතිග්‍රහණ ප්‍රවෘත්ති සංග්‍රහ සහ පරිගණක ගොනු මෙම ඒකාබද්ධ සූචියට තොරතුරු එවීම සඳහා උපයෝගී කරගෙන ඇත. සමාජ විද්‍යා ඒකාබද්ධ සූචිය සම්පාදනය කළ සංවර්ධන තොරතුරු මධ්‍යස්ථානය මෙන් ම පරිසර අධිකාරිය ද ISI දත්ත පදනම මේ සැලසුම් සඳහා උපයෝගී කර ගැනීම නව තාක්ෂණය සමග ඉදිරියට යාමක් ලෙස සඳහන් කළ හැක.

පුස්තකාල සූචි හා ඒකාබද්ධ සූචි යන දෙවර්ගයට ම වඩා වෙනස් වූවක් ලෙස ජාතික ඒකාබද්ධ සූචිය හැඳින්විය හැකිය. හැරල්ඩ් (1987 ) සිය පාරිභාෂික ශබ්ද මාලාවේ ජාතික ඒකාබද්ධ සූචිය හඳුන්වා ඇත්තේ මෙසේය.

> The national union catalogue a cumulative author list represents Library of Congress printed cards and titles reported by other American libraries. It commenced publication in 1948…

කිසියම් රටක පුස්තකාල පද්ධතියේ ම පුස්තකාල ද්‍රව්‍යවල සම්පූර්ණ එකතුව පිළිබඳව ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු ඇතුළත් එක් ක්‍රමයකට හෝ ක්‍රම කිහිපයකට සංවිධානය කළ ලැයිස්තුවක් ලෙස මෙය හැඳින්විය හැකිය. ජාතික ඒකාබද්ධ සූචිය සම්පාදනය කිරීම හා මැනවින් නඩත්තු කිරීම ජාතික පුස්තකාලයේ කාර්යයක් මෙන් ම ප්‍රධාන වගකීමක් ලෙස සැලකේ. ලෝකයේ සෑම රටක් ම එම රටවල ජාතික ඒකාබද්ධ සූචි සම්පාදනය කිරීමේ කාර්යයෙහි මූලිකත්වය ගෙන ක්‍රියා කර ඇති බව ඒ පිළිබඳ ඉතිහාසයෙන් පැහැදිලි වේ. මේ නිසා එක් ස්ථානයක සිට අනිකුත් පුස්තකාලයන්හි ඇති පුස්තකාල සම්පත් පිළිබඳ පර්යේෂකයන් හා අනිකුත් පාඨකයන්ට තොරතුරු ලබා ගත හැක.

අප රටේ ජාතික ඒකාබද්ධ සූචි සම්පාදනය කිරීම පිළිබඳව මුලින් ම සඳහන්ව ඇත්තේ 1967 කොළඹ දී පැවැත්වූ යුනෙස්කෝ විශේෂඥ රැස්වීම පිළිබඳ වාර්තාවෙහිය. එම වාර්තාවේ යෝජිත ශ්‍රී ලංකා ජාතික පුස්තකාල කාර්යයන් අතර අප රටේ පොත පත පිළිබඳව ඒකාබද්ධ සූචියක් සකස් කිරීම දක්වා ඇත. මේ අනුව මෙම යුනෙස්කෝ වාර්තාව අප රටේ ඒකාබද්ධ සූචි සම්පාදනය පිළිබඳව ඉතිහාසයේ ඉතා වැදගත් සනිටුහනක් ලෙස සැලකිය හැකිය. 1970 ආරම්භ කළ ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය සිය මාණ්ඩලීය පත්‍රිකා අංක 53 (1974) ජාතික පුස්තකාලය ජාතික ග්‍රන්ථ විඥාපන මධ්‍යස්ථානය වශයෙන් ලංකාවේ ප්‍රධාන පුස්තකාලවල නවකතා නොවන පොත්වල ඒකාබද්ධ සූචියක් පවත්වාගෙන යාම දක්වා ඇත. මේ අනුව ආරම්භ වකවානුවෙහි සිට මෙම කාර්යයෙහි ලා පුස්තකාල සේවා මණ්ඩලය සිය අවධානය යොමු කර ඇති බව පැහැදිලිය. මෙහිදී එතෙක් තිබුණු ඒකාබද්ධ සූචි ජාතික ඒකාබද්ධ සූචියේ සම්පාදනය සඳහා යොදා ගැනීම සඳහා බලධාරීන් කටයුතු කිරීම අගය කළ යුතුය. අමරසිංහ, එන්. (1982) පෙන්වා දී ඇති පරිදි සාමූහික ප්‍රතිග්‍රහණය පුස්තකාල හුවමාරු හා අන්තර් පුස්තකාල බැහැර දීම ආදී පුස්තකාල සහයෝගිතා ක්‍රම ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් ඒකාබද්ධ සූචියක අවශ්‍යතාවය දක්වා ඇත්තේ මෙසේය. මෙහි දී මොහු ජාතික ඒකාබද්ධ සූචිය (Master Catalogue) වශයෙන් හඳුන්වා ඇත.

> The need for union catalogue has been felt mainly for cooperative acquisition and for acquisition and for exchange and loan purposes. The national library has taken steps to complete a master catalogue of all monographs in sciences in social sciences in libraries in the island using existing library networks. The scientific and technological fields are covered by the SLSTIC. It has anticipated that these two union catalogues will be able to be merged at some future date

මේ අනුව 1982 වන විට ජාතික පුස්තකාල සේවා මණ්ඩලය රටේ ඇති සියලු පුස්තකාල ජාලවල සමාජ විද්‍යාව පිළිබඳ සියලු කෘතීන් සම්බන්ධයෙන් ඒකාබද්ධ සූචියක්

සම්පාදනයෙහි පියවර ගෙන තිබීම හා නුදුරු අනාගතයේ දී මෙය UNICAST සමග එක් කිරීම සම්බන්ධයෙන් බලාපොරොත්තු විය හැකි සන්ධිස්ථානයකි. පුස්තකාල සේවා මණ්ඩලය මගින් 1986 දී ජාතික ඒකාබද්ධ සූචිය පුස්තකාල 6 ක දායකත්වයෙන් ආරම්භ කරන ලදී. විශ්වවිද්‍යාල පුස්තකාල තුනක් ද, මහජන පුස්තකාල දෙකක් ද , විශේෂ පුස්තකාලයක් ද වශයෙනි. 1968 දායක පුස්තකාල සංඛ්‍යාව 22 දක්වා වර්ධනය විය. 1991 වන විට දායක පුස්තකාල එකතුන් පිළිබඳ තොරතුරු සූචි පත්‍රිකා, ඡායා පිටපත්, මුද්‍රිත පිටපත්, යතුරු ලියන පිටපත් පමණක් නොව සමහර පුස්තකාල පරිගණක මුද්‍රිත පිටපත් මගින් සැපයීමත් ආරම්භ කර තිබිණි.

ජාතික ඒකාබද්ධ සූචියක් සම්පාදනයෙහි ලා මුහුණ පාන්නට සිදු වන සහ සිදු වෙමින් පවතින අපහසුතා පිළිබඳ කරුණු ද සඳහන් කළ යුතුය. දායක පුස්තකාල මගින් තොරතුරු සැපයීමේදී ඒකාකාර ස්වරූපයක් නොගැනීම මෙහි ලා ප්‍රධානය. සූචි පත්‍රිකා මගින් තොරතුරු එවන විට ප්‍රධාන සංලේඛය ලෙස ලැබෙන කාඩ්පතට අමතරව ග්‍රන්ථ නාම හා විෂය වශයෙන් තවත් සංලේඛ 2 ක් ද පිළියෙල කිරීමට ජාතික පුස්තකාලයට සිදු විය. සූක්ෂ්ම සේයා පත්‍ර ඒවා කියවීම හා මුද්‍රණ යන්ත්‍රණයේ ආධාරයෙන් සූක්ෂ්ම සේයා පත්‍රවල ඡායා පිටපත් ලබාගෙන ඒවා භාවිතයෙන් සංලේඛ 03 බැගින් යතුරු ලියනය කිරීමේ විශාල වගකීම ද ජාතික පුස්තකාලයට පැවරිණි.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය පරිගණක ගත කළ යුතු කාර්යයන් අතර ඒකාබද්ධ සූචිය ප්‍රමුඛත්වය දිය යුතු කරුණක් ලෙස හඳුනාගෙන තිබීම ඉතා වැදගත්ය. එහෙත් ජාතික ඒකාබද්ධ සූචියට දායක වන සියලු පුස්තකාල සිය එකතුන් පරිගණක ගත කර නොතිබීම මෙහි ලා වර්තමානයේ පවතින ගැටලුවක් ලෙස පෙන්වා දිය හැකිය. මෙසේ පරිගණක ගත කර නොමැති පුස්තකාලවලින් කාඩ්පත් ස්වරූපයෙන් ද තොරතුරු ලබා ගැනීමට සිදුව ඇත. මෙම විවිධ ගැටළු මධ්‍යයේ වුව ද ඒකාබද්ධ සූචි සම්පාදනය සඳහා පරිගණක පද්ධතියක් බිහිකිරීමටත්, දත්ත ප්‍රවේශ කිරීම සඳහා පොදු ආකෘතියක් පිළියෙල කිරීමටත් දායක පුස්තකාල දැනුවත් කිරීම සඳහා වැඩමුළු හා සම්මන්ත්‍රණ ආදිය පැවැත්වීමත් ජාතික පුස්තකාලයේ අගය කළ හැකි අනාගත සැළසුම් ලෙස දැක්විය හැකිය.

මේ අන්දමට ජාතික ඒකාබද්ධ සූචිය සඳහා පරිගණක පද්ධතියක් බිහිකර එමගින් පරිගණක ඒකාබද්ධ සූචිය සම්පාදනය කළ හැක. පද්ධතියට අයත් පුස්තකාල නව ප්‍රතිග්‍රහණ පිළිබඳ විඥාපන පද්ධතියේ ප්‍රධාන ගබඩාවට ඇතුළත් කිරීමෙන් ඒකාබද්ධ සූචිය නිරතුරුව ම යාවත්කාල වේ. මේ අන්දමට ජාතික ඒකාබද්ධ සූචිය නිරතුරුවම පවත්වාගෙන යාම අත්‍යාවශ්‍යය. මෙහි ලා පර්යේෂකයන්ට හෝ වෙනත් ඕනෑම පාඨකයෙකුට ඒකාබද්ධ සූචිය කියවීම, ගවේෂණය, පිටපත් කිරීම, සංශෝධනය, පද්ධතියේ ඕනෑම පුස්තකාලයක සිට කළ හැකිය. මෙය ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩය ජාතික ඒකාබද්ධ සූචිය සම්පාදනය සම්බන්ධයෙන් පරිගණක පද්ධතියක් බිහිකිරීමට දැනටමත් ගෙන ඇති මූලික පියවරවල අනාගත ප්‍රතිඵල ලෙස නුවා දැක්විය හැක. මෙම ජාතික කර්තව්‍යයෙහි ලා ශ්‍රී ලංකාවේ ඇති අනිකුත් සියලු පුස්තකාල ජාතික පුස්තකාලයට සහයෝගය ලබා දීම අත්‍යාවශ්‍යය.

මේ අනුව විමසන විට 20 සියවසේ ආරම්භයේ ඇමෙරිකාවේ කොංග්‍රස් පුස්තකාලයෙන් ආරම්භ වුණු ඒකාබද්ධ සූචි නිර්මාණ කාර්යය අප රට සම්බන්ධයෙන් 21 සියවසට පා

තබන තුරු සම්පූර්ණ කර ගත නොහැකි වුණු ක්‍රියා දාමයකි. එහෙත් දියුණු වෙමින් පවතින රටක් ලෙස පසුගිය දශක තුනක සිට මේ සම්බන්ධයෙන් පියවර රාශියක් ගෙන ඇති බව ඉහතින් දක්වා ඇත. 1977 දී මෙරට ප්‍රථම ඒකාබද්ධ සූචිය මෙම කාර්යයෙහි ලා මග පෙන්වීමකි. කෙසේ වෙතත් රටක පුස්තකාල සේවා විධිමත්ව පවත්වාගෙන යාම සඳහා අත්‍යවශ්‍ය වූ ඒකාබද්ධ සූචි සම්පාදනය ජාතික කර්තව්‍යයක් ලෙස සලකා අතීතයට හා වර්තමානයට වඩා ප්‍රමුඛත්වයක් දී කටයුතු කිරීමෙන් නුදුරු අනාගතයේ දී ම ජාතික ඒකාබද්ධ සූචියේ ප්‍රතිඵල පාඨකයින්ට අත් කර දිය හැක.

### විමර්ශන


Amarasingha, N. (1983) National Library Services in Sri Lanka *Library News*,3 (3-4)

Allen Kent [ et al] (1975) Encyclopedia of library and Information Science Vol.31, New York: Marcel Dekker, 391-455

Harrison , Colin ; Oated , Rosmary (1981) The basic of librarianship London : The Library Association

Harrod, Leonard Montague (1987) ; The Librarian 'Glossary of Terms used in Librarianship Documentation and the book crafts and reference book 6th ed. English :Gower,

Silvia, Bernadeen (1975) Library cooperation in Sri Lanka, A Must.- Libraries and people(a commemorative volume) edited by Ishvari Corea, Colombo: Public Library, 203-207 p.

Yapa,N.U (1978) Sri Lanka Science & Technological Information Center (SLSTIC) Of the National Science Council of Sri Lanka, *Vidurawa,* 3(1)

Yapa, N.U (1972) Impact of computerization on cataloguing Sri Lanka *Library Review*, 7(1 –2) 1-8 p.

Yapa, N.U (1999)Cooperative software for library networking: Sri Lanka experience/ paper presented at the Networking for effective Libraries and information services, IFLA-SLLA workshop for the South Asia,17-22 Oct.

යාපා එන් යූ (1985) පුස්තකාල සම්පත් පරිහරණය "දිවයින" නොවැම්බර් 21